" ඌව අභියෝගයන් අභිමානයට "
**ඌව පළාත් සභාව**
ஊவா மாகாண சபை
**UVA PROVINCIAL COUNCIL**
ඌව පළාතේ ප්‍රධාන ලේකම් කාර්යාලය
ஊவா மாகாண பிரதான செயலாளர் அலுவலகம்
**OFFICE OF THE CHIEF SECRETARY, UVA PROVINCE**
රජ වීදිය, බදුල්ල. இராஜ வீதி, பதுளை King's Street, Badulla

මගේ අංකය / எனது இல / My No. } 4/AD/FM/02/05/02 - I
ඔබේ අංකය / உமது இல / Your No. }
දිනය / திகதි / Date } 2025.12 03

කළමනාකරු,
ලේක්හවුස් නියෝජිත දැන්වීම් කාර්යාලය,
මුතියංගන ඔරලෝසු කණුව ඉදිරිපිට,
බදුල්ල.

මහත්මයාණෙනි,

<u>**ලේක්හවුස් පුවත්පත් වල දැන්වීම පළකර ගැනීම**</u>

මේ සමඟ අමුණා එවනු ලබන ඌව පළාත් සභා ආයතනවලට ආරක්ෂක සේවා ලබා ගැනීම සඳහා මිල ගණන් කැඳවීමේ කාලය දීර්ඝ කිරීමට අදාළ දැන්වීම **දිනමිණ, ඩේලිනිවුස්** හා **තිනකරන්** යන පුවත්පත් වල පලකර දෙන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

02. එම දැන්වීම 2025.12.05 වන දින පල කරදෙන ලෙසත්, එයට අදාල ගෙවීම් චෙක්පත දැන්වීම් ඉන්වොයිසිය හා පල කරන ලද දැන්වීමේ උද්‍ධෘතය ලද පසු ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම නමින් ලබාදෙන බවත් වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

මෙයට-විශ්වාසී,

(දයානන්ද රත්නායක)
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)

දුරකථන අංකය :- 055-2229393
ෆැක්ස් අංකය :- 055-2231670
විද්‍යුත් ලිපිනය :- updcspalana@gmail.com

# ඌව පළාත් සභාව

## ප්‍රසම්පාදන දැන්වීමයි

**ආරක්ෂක සේවා ලබාගැනීම සඳහා මිල ගණන් කැඳවීම - 2026**

01. ඉහත මිල ගණන් කැඳවීමට අදාලව 2025.11.13 දින **දිනමිණ, ඩේලිනිවුස් හා තිනකරන්** යන පුවත්පත් වල ප්‍රසිද්ධ කරන ලද පුවත්පත් දැන්වීම හා බැඳේ.

02. එම දැන්වීමට අනුව අදාල ලංසු ඉදිරිපත් කිරිමට 2025.12.05 දින ප.ව. 2.00 දක්වා කාලය ලබා දී තිබුණි. නමුත්, මේ වන විට රට තුළ පවතින හදිසි ආපදා තත්ත්වය හේතුවෙන් එම ලංසු ඉදිරිපත් කිරීමේ කාල සීමාව 2025.12.12 දින පෙ.ව.10.00 දක්වා දීර්ඝ කළ බව මෙයින් දන්වමි.

03. ඒ අනුව, නිසි පරිදි සම්පූර්ණ කරන ලද ලංසු පිටපත් දෙකකින් යුතුව **2025.12.12** දින පෙ.ව. **10.00** ට පෙර ප්‍රසම්පාදන කමිටුව වෙත ඉදිරිපත් කළ යුතු අතර, එදින පෙ.ව. **10.30** ට බදුල්ල, ඌව පළාත් සභා නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) කාර්යාලයේ දී ලංසු විවෘත කරනු ලැබේ. අදාල වැඩි විස්තර දුරකතන අංක 055-2229393 අමතා මෙම කාර්යාලයෙන් හෝ www.cs.up.gov.lk වෙබ් අඩවියෙන් ලබාගත හැකිය.

04. ලංසු ලේඛන **2025.12.12** දින පෙ.ව **9.00** දක්වා රාජකාරි වේලාවන් තුළදී නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) කාර්යාලයෙන්ද, නැත්නම් www.cs.up.gov.lk වෙබ් අඩවියෙන්ද ලබාගත හැකිය.

05. ප්‍රසම්පාදන මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

සභාපති,<br>
ප්‍රසම්පාදන මණ්ඩලය<br>
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) කාර්යාලය<br>
ඌව පළාත් සභාව, බදුල්ල.<br>
2025.12.05